විසර්ජන ශීර්ෂය - 319- සබරගමුව පළාත් සභාව

විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

01. මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

(අ) මෙහෙවර

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියළුම සම්පත් ඵලදායිව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙර ගමනකට.

(ආ) ප්‍රධාන කාර්යයන්

(i) 1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල හා කාර්යය පද්ධතිය ක්‍රියාවට නැංවීම.

(ii) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවට පැවරී ඇති ආදායම් පිළිබඳ ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා සමාලෝචනය.

(iii) පළාත් මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම සහ නව මාර්ග හා විකල්ප මාර්ග ඉදිකිරීම.

(iv) පළාත තුළ සංචාරක ආකර්ශනය වර්ධනය හා සංවර්ධනය කිරීම.

(v) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට එකඟවන ආකාරයට අධ්‍යාපන සැලසුම් සකස් කොට ක්‍රියාවට නැංවීම.

(vi) නිවාස, මගී ප්‍රවාහන හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(vii) විදුලිබල පහසුකම් නොමැති ග්‍රාමීය ජනතාවට විදුලි බලය සැපයීම සහ විකල්ප විදුලිබල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(viii) විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් වෙනුවෙන් සවිබල ගැන්වීම සහ අනාථ, අසරණ සහ නොමඟ ගිය දරුවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් වෙනුවෙන් පහසුකම් සැලසීම.

(ix) පළාත තුළ බටහිර හා දේශීය වෛද්‍ය කටයුතු සම්බන්ධීකරණය, රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්ති පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සහාය වීම හා කාන්තා කටයුතු සංවර්ධනය කිරීම.

(x) ඉඩම් පළාත් වාරිමාර්ග සංවර්ධනය, කෘෂිකාර්මික කටයුතු පුළුල් කිරීම සහ පරිසර සංරක්ෂණය හා සංවර්ධනය.

02. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.14,360,324,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.12,585,096,378 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.1,775,227,622 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12.36 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 11,243,324,000 | 11,347,324,000 | 10,736,939,000 | 610,385,000 | 5.38 |
| මූලධන | 3,005,000,000 | 3,013,000,000 | 1,848,157,378 | 1,164,842,622 | 38.66 |
| එකතුව | 14,248,324,000 | 14,360,324,000 | 12,585,096,378 | 1,775,227,622 | 12.36 |